# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 58 — 1973 මැයි 04 වැනි සිකුරාද — 1973.05.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 447 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 449 | අය-වැය ලේඛන ... ... ... | 456 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 452 | දේපල විකිණීම ... ... ... | 457 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 454 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 458 |


**සැළකිය යුතුයි.**—(i) මුද්දර (සංශෝධන) පනත් කෙටුම් පත 1973 අප්‍රේල් 19 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී. (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරණ මුදල් හා ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත 1973 මැයි මස 04 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලවේ.

## පළාත් පාලන නිවේදන

එල් ජීඩී/සීපී/10/13

**සුළු නගර සභා ආඥාපනත**

183 වන වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල් ඩී. ඩයස් බණ්ඩාරනායක වන මම, ඉහත කී වගන්තිය යටතේ පුස්සැල්ලාව නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ 1973 පෙබරවාරි 05 වැනි දින අංක 45/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් 1973 මැයි මස 4 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම ආඥාව මෙයින් සංශෝධනය කරමි :—

"(ආ) ඒ නගරය වෙනුවට එකී ආඥාපනත යටතේ අලුත් සුළු නගර සභාවක් සංස්ථාපනය කැරෙන තුරු පුස්සැල්ලාව නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ සුළු නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස ද විශේෂ කොමසාරිස් වරයා වශයෙන් ගම්පොළ, නාවල පාරේ අංක 294/5 හි ලියනගේ ශ්‍රාන්විල් ඩික්සන් පෙරේරා මහතා පත් කරමි."

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1973 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ දී ය.

5–131—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

1973 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ඇල් ඩී—බී 125/34

**සුසාන භූමි හා භූමදාන ආඥාපනත**

5 වන වගන්තිය යටතේ වූ නියමය

(231 වන අධිකාරය වන) සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමය.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1973 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

1. මෙහි වූ "ආ" උපලේඛනයේ නිශ්චිත ලෙස නිරූපනය කර තිබෙන්නා වූ සීමා ඇතුලත මළවුන් භූමදාන කිරීම පිණිස හෝ ආදාහනය කිරීම පිණිස හෝ මෙහි වූ "අ" උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමෙහි පොදු සුසාන භූමියක් 'මෙයින් පිහිටුවනු ලැබේ.

2. මේ නියමයේ 1 වන ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පොදු සුසාන භූමිය, සුසාන භූමි හා භූමදාන ආඥා පනතේ 10, 15, 16 සහ 23 වන වගන්තිවල බලපෑමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතුය.

"අ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැදපත්තු ගම් සහා බල ප්‍රදේශයේ පිහිටි කිරිඇල්ල ග්‍රාමසේවක වසමේ අංක 182 වන අවසාන ගම් සිතියමේ 2 වන අතිරේකයේ වඩාත් පැහැදිලිව විස්තර කර ඇති අංක 370 දරණ කොරලැස්ස වත්ත නමැති අක්කර 2 රූඩ් 0, පර්. 06.3 ක් (අක්කර දෙකයි (රූඩ් නැත) පර්චස් හයයි දශම තුනක්) විශාල ඉඩම.

ඉඩමේ මායිම් මෙසේ යි :—

උතුරට: අංක 182 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 216 දරණ බිම් කට්ටියද,

නැගෙනහිරට: අංක 182 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 210 දරන බිම් කට්ටියද,

දකුණට: අංක 182 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 210 දරණ බිම් කට්ටියද,

බස්නාහිරට: අංක 182 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 210 දරණ බිම් කට්ටියද,

"ආ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් ප්‍රදේශයේ කිරිඇල්ල ග්‍රාමසේවක වසමට අයත් ඉඩන්ගොඩ ගම සහ කිරිඇල්ල ගමේ කොටසකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස.

5–103/1—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 125/34

**සුසාන භූමි හා භූමදාන ආඥාපනත**

5 වන වගන්තිය යටතේ වූ නියමය

(231 වන අධිකාරය වන) සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමයයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යවරයා.

1973 ක්වූ අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

1. මෙහි වූ "ආ" උපලේඛනයේ නිශ්චිත ලෙස නිරූපනය කර තිබෙන්නා වූ සීමා ඇතුලත මළවුන් භූමදාන කිරීම පිණිස හෝ ආදාහනය කිරීම පිණිස හෝ මෙහි වූ "අ" උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමෙහි පොදු සුසාන භූමියක් මෙයින් පිහිටුවනු ලැබේ.

2. මේ නියමයේ 1 වන ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පොදු සුසාන භූමිය, සුසාන භූමි හා භූමදාන අඥාපනතේ 10, 15, 16 සහ 23 වන වගන්තිවල බලපෑමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතුය.

"අ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ මැද පත්තු ගම් සභා බල ප්‍රදේශයේ යටිපව්ව ගාමයෙහි පිහිටි, සර්වේ ජනරාල්තුමා විසින් පිළියෙල කරනු ලැබ ඔහු භාරයේ තිබෙන අංක 218 දරණ අවසාන ගම් සැලැස්මෙහි බිම් කට්ටි අංක 623 වශයෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්කර එකයි (රූඩ් නැත) පර්චස් දශම තුනක් (අක්කර 1, රූඩ් 0, පර්චස් 0.03 ක්) සියලුම දිශාවලට එකී සැලැස්මේ අංක 624 දරණ බිම් කට්ටිය මායිම් වූ තහන්දි කැළේ මූකලාන නමැති ඉඩම.

"ආ" උපලේඛනය

රත්නපූර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ යටිපව්ව ග්‍රාම සේවක වසමේ පිහිටි ඇල්ලගාවා නැමැති ග්‍රාමයෙන් සමන්විත සම්පූර්ණ බිම් ප්‍රදේශය.

5–103/2—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

ඇල් - ඩී.—බී. 125/34

**සුසාන භූමි හා භූමදාන ආඥාපනත**

5 වන වගන්තිය යටතේ වූ නියමය

(231 වන අධිකාරය වන) සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමයයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යවරයා.

1973 ක්වූ අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

1. මෙහි වූ "ආ" උපලේඛනයේ නිශ්චිත ලෙස නිරූපනය කර තිබෙන්නා වූ සීමා ඇතුලත මළවුන් භූමදාන කිරීම පිණිස හෝ ආදාහනය කිරීම පිණිස හෝ මෙහි වූ "අ" උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමෙහි පොදු සුසාන භූමියක් මෙයින් පිහිටුවනු ලැබේ.

2. මේ නියමයේ 1 වන ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පොදු සුසාන භූමිය, සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 10, 15, 16 සහ 23 වන වගන්තිවල බල පෑමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතුය.

"අ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැද පත්තු ගම් සභා බල ප්‍රදේශයේ හිඳුරන්ගල ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරනු ලැබූ ඔහු භාරයේ තිබෙන අංක 56 දරණ අවසාන ගම් සැලැස්මේ බිම් කට්ටි අංක 454 වශයෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්කර එකක් (අක්කර 1, රූඩ් 0, පර්චස් 00) ඇති සියලුම දිශාවලට එකී සැලැස්මේ අංක 457 දරණ බිම් කට්ටිය මායිම් වූ, ගනේමූකලාන නැමැති ඉඩම.

"ආ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ හිඳුරන්ගල ග්‍රාම සේවක වසමට අයත් හිඳුරන්ගල නමැති ග්‍රාමයෙන් සමන්විත සම්පූර්ණ බිම් ප්‍රදේශය.

5–103/3—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

ඇල්. සී—බී. 125/34.

### සුසාන භූමි හා භූමදාන ආඥාපනත

### 5 වන වගන්තිය යටතේ වූ නියමය

(231 වැනි අධිකාරය වන) සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවනු ලැබූ නියමය.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1973 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ දී ය.

#### නියමය

1. මෙහි වූ "ආ" උපලේඛනයේ නිශ්චිත ලෙස නිරූපනය කර තිබෙන්නා වූ සීමා ඇතුළත මළවුන් භූමදාන කිරීම පිණිස හෝ අදාහනය කිරීම පිණිස හෝ මෙහි වූ "අ" උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමෙහි පොදු සුසාන 'භූමියක්' මෙයින් පිහිටුවනු ලැබේ.

2. මේ නියමයේ 1 වන ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පොදු සුසාන භූමිය, සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 10, 15, 16 සහ 23 වැනි වගන්තිවල බලපෑමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතුය.

#### "අ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැදපත්තු ගම්සභා බල ප්‍රදේශයේ නාදුරන නමැති ගමෙහි පිහිටි අංක 53 දරණ අවසාන ගම් සැලැස්මෙහි බිම් කට්ටි අංක 285 වශයෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් රූඩ් දෙක කුත් පර්චස් තිස් අටක් (අක්. 0, රූඩ්. 2, පර්. 38) ඇති සියලුම දිශාවලට එකී සැලැස්මේ අංක 286 දරණ බිම් කට්ටිය මායිම් වූ ගතේලන්ද මූකලාන නමැති ඉඩම.

#### "ආ" උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ කිරිපෝරුව ග්‍රාමසේවක වසමට අයත් නාදුරන නැමැති ග්‍රාමයෙන් සමන්විත සම්පූර්ණ බිම් ප්‍රදේශය.

5–103/4—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

### පළාත් පාලන (පාලන ප්‍රදේශ) ආඥාපනත

### 265 වන පළාත් පාලන (පාලන ප්‍රදේශ) ආඥාපනත

පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

ලංකා පරිපාලන සේවයේ III පන්තියේ එච්. පී. විජේසිංහ මහතා 1973 ජනවාරි 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෑගල්ල ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. එන්. බී. ඩබ්ලිව්. එම්. මන්ත්‍රීපාල මහතා 1973 ජනවාරි 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අනුරාධපුර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ කේ. ජී. ඩී. විමල සිරි මෙනවිය 1973 ජනවාරි 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මාතලේ ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එච්. එම්. එච්. බණ්ඩා මහතා 1973 පෙබරවාරි 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කුරුණෑගල ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ විමර්ශණ නිලධාරි, ටී. බී. වර්සකෝන් මහතා 1973 පෙබරවාරි 17 වැනි දින සිට ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ පී. එම්. පේමතිලක මහතා නැවත රාජකාරි භාරගන්නාතුරු මොණරාගල ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973 අප්‍රේල් 10,
කොළඹ දී ය.

5–35—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු – ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

**1. දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ව්‍යවහාර දීමනාවක් ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි.

**3. සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදළ නිළධාරීතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුද හරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි

යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 8ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම්කොට නැත්නම් අවුරුදු තුන් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දැනට පවත්නා වූත් හෝ මින් මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාල පරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු නියමිත වැටුප් වැඩිවීම නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අවම සුදුසුකම් වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුරු ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදාළ වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලීව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදාළ නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අවම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධ යෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට සුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම් කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුහි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැල්දී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත්

ආකෘතිය

පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

——————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :—————
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :—————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :—————.
ජාතිය :—————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :—————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—.
අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඇ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, කරාතිරම්, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණ තාවක් ඇද්ද :—

(අ) සිංහල :————

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබූයේද, එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

### පුස්තකාල භාරකරු තනතුර—මාලිම්බඩ ගම්සභාව

මෙම මාලිම්බඩ ගම්සභාවේ මහජන පුස්තකාලයේ භාරකරු තනතුර සඳහා මාලිම්බඩ ගම්සභා ප්‍රදේශ සීමාව තුළ ස්ථිර පදිංචියක් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම මාලිම්බඩ ගම්සභාවේ සභාපතිතැන වන මා විසින් ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

ඉල්ලුම් පත් 1973 ජූනි මස 18 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙළ කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අවශ්‍ය සුදුසුකම්.—

1. ඉල්ලුම්කරුවන් මාලිම්බඩ ගම්සභා ප්‍රදේශ සීමාව තුළ ස්ථිර පදිංචියක් ඇති ලාංකිකයින් විය යුතුයි.

2. ඉල්ලුම්කරුවන් අ.පො.ස. (සාමාන්‍ය) විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් අය විය යුතුයි.

3. මෙම තනතුරට පත්කරනු ලබන අය කාර්යාලයේ ලිපිකටයුතු සඳහාද සහාය විය යුතු අතර, සිංහල යතුරු ලියනය පිළිබඳ දැනුමක් ද තිබිය යුතුය.

4. ඉල්ලුම්කරුවන් අයදුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 20 ට වැඩි අවුරුදු 30 ට අඩු අය විය යුතුයි.

5. පුස්තකාල කටයුතු හා කාර්යාල ලිපි කටයුතු සම්බන්ධ පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ඇත.

වැටුප් හා සේවා කොන්දේසි.—

1. පත්කරගනු ලබන අයට රු. 504—30—744 යන වාර්ෂික වැටුප් ක්‍රමයට අදාල ඒකාබද්ධ වැටුපක් ගෙවනු ඇත.

2. පත්කරගනු ලබන අය ස්වේච්ඡක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. පත්කර ගනු ලබන අය පළාත් පාලන සේවා කොමිෂන් සභාව මගින් හා ගම්සභාව මගින් පනවා ඇති සේවා කොන්දේසි හා විටින් විට පනවනු ලබන සේවා කොන්දේසිවලට යටත්ව සේවය කළ යුතුයි.

4. පත්කරගනු ලබන අයගේ සේවය එක් මසක දැන්වීමකින් නතර කිරීමට ගම්සභාවට බලය ඇත.

අවශ්‍ය සහතික.—

මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (ග්‍රාමසේවක සහතිකය ඇතුළුව), අධ්‍යාපන සහතිකය, උප්පැන්න සහතිකය හා පළපුරුද්ද පිළිබඳ සහතික යන සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතුයි.

එන්. ඒ. ගුණදාස,
වැ. බ. සභාපතිතැන, මාලිම්බඩ ගම්සභාව.

1973 අප්‍රේල් මස 23 වැනි දින,
මාලිම්බඩ ගම්සභා කාර්යාලය, තෙලිජ්ජවිල.

#### ඉල්ලුම් පත්‍රය

#### පුස්තකාල භාරකරු තනතුර—මාලිම්බඩ ගම්සභාව

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. (අ) ලිපිනය :————. (ස්ථිර පදිංචිය)
   (ආ) ගම්සභා කොට්ඨාශය :————.
3. ජාතිය හා පුරවැසි භාවය :————.
4. අධ්‍යාපන සුදුසුකම් :————.
5. උපන් දිනය හා ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස :————.
6. පුස්තකාල කටයුතු හා ලිපි කටයුතු පිළිබඳ දැනුම :————.
7. යතුරු ලියනය පිළිබඳ පළපුරුද්ද :————.
8. වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒවා :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-126—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

#### පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ (II වැනි ශ්‍රේණියේ) නිලධාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1973.07.21 දින

පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ (II වැනි ශ්‍රේණියේ) නිලධාරීන් සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය 1973. 07. 21 දින කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසිනි.

**2. අයදුම්පත්.**—(අ) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, "ලේකම්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ 1" යන ලිපිනයට එවිය යුතුයි.

(ආ) අයදුම්පත් 1973.06.11 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දැනට සේවයේ නියුක්ත ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් එවිය යුතුයි. මෙසේ කිරීමට යම් අපේක්ෂකයකු අපොහොසත් වුවහොත්, ඔහු නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

(ඈ) 1973.06.11 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(ඉ) මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත :—

(i) පළමු වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ii) ඉන්පසු එක් එක් වතාව සඳහා—
සම්පූර්ණ විභාගය සඳහා රු. 15 යි.
එක් විෂයයකට රු. 7.50 යි.

අපේක්ෂකයින් විසින් අත්සන තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිට ඇති අපේක්ෂකයින්ට, ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ.

**3. විභාගයට ඇතුළත් කර ගැනීම.**—(අ) පිළිගනු ලැබූ අයදුම්පත් හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත්කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(ආ) අයදුම්කරුවන් තමනට නියමිත විභාග ශාලාවෙහි පෙනී සිටිය යුතුයි. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත්වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

(ඇ) ප්‍රවේශ පත්‍රයක් සමග කාල සටහන් පිටපතක් ද අපේක්ෂකයින් වෙත එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයෙහි දී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාරදිය යුතුයි.

(ඈ) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු, ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ 1" යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුන බව දැනුම්දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුයි :—

(i) විභාගයේ නම :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(iii) සම්පූර්ණ ලිපිනය :————.

**සැලකිය යුතුයි.**—විභාගයට ඇතුළත් කර ගැනීම, ඊට සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

4. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

**5. විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පිළිගනු ලැබූ අයදුම්පත් හිමි ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස, ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**6. හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(අ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්.

(ආ) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්.

(ඇ) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

(ඇ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක් :—

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති........ .............................................................................. යන

(අයදුම්කරුගේ නම)

අයගේ බව මම සහතික කරමි.

————,

(අයදුම්කරුගේ අත්සන)..

(අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.)

නම හා තරාතිරම :..................................................

දිනය :............................................

විභාග ශාලාවේ දී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

**7. විභාග පරිපාටිය.**—පහත සඳහන් වන්නේ විභාගය සඳහා නියමිත විෂයයන් හා ඒ ඒ විෂයයන් සඳහා නියමිත ලකුණුත් ය :—

(අ) සිංහල, දෙමළ ජාතික භාෂා දෙක, මෙම පරීක්ෂණය කොටස් දෙකකින් යුක්ත වේ. එනම් :—

| | | ලකුණු |
|---|---|---|
| (i) සාකච්ඡා හා අර්ථ නිරූපනය | ... | 100 |
| (ii) කියවීම හා ලිවීම | ... | 100 |

ඉහත සඳහන් (අ) (i) නීතිය යටතේ කරනු ලබන පරීක්ෂණයේ දී අයදුම්කරුගේ, වෙනස් වෙනස් තරාතිරම්වල සිංහල හෝ දෙමළ හෝ අවබෝධ කර ගැනීමේ ශක්තියත්, සාමාන්‍ය සාකච්ඡාවලදී සහ රාජකාරි කටයුතුවල දී ඒ භාෂා දෙක තේරුම් ගැනීමේ ශක්තියත් පිළිබඳව පරීක්ෂකයා තෘප්තිමත් කිරීම පිණිස වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පරීක්ෂකවරුන් සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමක් නැති සිංහල සහ දෙමළ පුද්ගලයින් අතර භාෂා පරිවර්තකයෙකු ලෙස ක්‍රියා කිරීමට ද ඔහුට නියම කරනු ලැබේ. මෙහිදී භාෂා පරිවර්තනය කරනු ලබන්නේ සාමාන්‍ය රාජකාරි කටයුතුවලට අදාල දේ සම්බන්ධයෙනි. මේ පරීක්ෂණයේ දී සම්පූර්ණ ලකුණු සියයට 40 ක් අයදුම්කරු විසින් ලබා ගැනීම අවශ්‍ය වේ.

| | | ලකුණු |
|---|---|---|
| (ආ) පළාත් පාලන ආයතනවල භාවිත වන ගිණුම් සහ 19 වැනි සහ 20 වැනි ඡේදයන් හැර, ආණ්ඩුවේ මුදල් රෙගුලාසිවල දෙවැනි කොටස (පැය 2 යි) | ... | 100 |
| (ඇ) පළාත් පාලන නීති (පැය 2 යි) | ... | 100 |

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. එනම් :—

**1 වැනි කොටස.**—නගර සභා, පළාත් ආණ්ඩු සභා සහ සුළු නගර සභා ආඥාපනතේ, ඒවා යටතේ සම්පාදිත නීති සහ අතුරු ව්‍යවස්ථා සහ පළාත් පාලන ආඥාපනත් හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසි පදනම් කරගෙන මෙම කොටසේ ප්‍රශ්න පිළියෙල කරනු ලැබේ.

**2 වැනි කොටස.**—මෙම කොටසේ ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ පහත සඳහන් ආඥාපනත්, ඒ යටතේ සම්පාදිත නීති, රෙගුලාසි සහ අතුරු ව්‍යවස්ථා පදනම් කරගෙනය :—

(අ) (i) වෙන්දේසිකරුවන් සහ තැරැව්කරුවන් පිළිබඳ ආඥාපනත.
(ii) සුසාන භූමි ආඥාපනත.
(iii) ගෝඝාතන ආඥාපනත.
(iv) ප්‍රාදේශීය බලමණ්ඩල සම්මත අතුරු ව්‍යවස්ථා පනත.
(v) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත.
(vi) විදුලි බල ආඥාපනත.
(vii) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත.
(viii) විනෝද බදු ආඥාපනත.
(ix) ආහාර හා ඖෂධ ආඥාපනත.
(x) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත.
(xi) ප්‍රාදේශීය බලමණ්ඩලවල ඡන්ද විමසීම් ආඥාපනත.
(xii) ජලභීතිකා රෝග ආඥාපනත.
(xiii) වීදි සම්මාදම් ආඥාපනත.
(xiv) නගර හා ග්‍රාම නිර්මාන ආඥාපනත.
(xv) වාහන ආඥාපනත.
(xvi) මිනුම් හා කිරුම් ආඥාපනත, සහ

(ආ) නාගරික සභාව, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා කාර්යාල සංවිධානය, කාර්යාල ක්‍රම හා ක්‍රියා පරිපාටිය.

(i) සිංහල, දෙමළ සහ මුස්ලිම් ජාතික නිලධාරීන් එක භාෂාවකින් සහ ගිණුම් පත්‍රයෙන් හා පළාත් පාලන නීති පත්‍රයෙන් සමත් විය යුතුයි.

(ii) අනිකුත් ජාතික නිලධාරීන් ගිණුම් සහ පළාත් පාලන නීති පත්‍ර වලින් හා එක් භාෂාවකින් (සාකච්ඡා කිරීම සහ අර්ථ නිරූපනයෙන් පමණක්) සමත් විය යුතුයි.

(iii) ඉහත සඳහන් 1 (ආ) සහ (ඇ) නීති යටතේ ගිණුම් පත්‍රයට සහ පළාත් පාලන නීති පත්‍රයට නියමිත ලකුණු ගණනින් සියයට 40 ක් අයදුම්කරු විසින් ලබාගත යුතුයි.

(iv) අයදුම්කරුවකු ඒ විෂයයන් වෙන් වෙන් වශයෙන් වෙනත් වාරවලදී ගැනීමට කැමැත්තේ නම්, ඔහුට එසේ කිරීමට පිළිවන.

**8. නිදහස් කිරීම.**—(i) වයස අවුරුදු 50 ට වැඩි එනම්, 1973.06.11 වැනි දිනට 50 (පනස්) වැනි ජන්ම දින ලබන නිලධාරීන්, කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ. එසේ නිදහස් කරනු ලබන්නේ, ඔවුන්ගේ වැඩ සහ හැසිරීම අනුව, එම අනුග්‍රහය දීමට උචිතයයි ද එක් එක් නිලධාරියා එම අනුග්‍රහය ලැබීමට සුදුස්සෙක් යයි ද කොමිෂන් සභාවට ඒත්තු ගියාට පසුවය.

(ii) 1946 අප්‍රේල් මස 1 දින පළාත් පාලන සේවයට මාරු කරන ලද සියළුම නිලධාරීන් මෙම විභාගයට නියමිත ජාතික භාෂා ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලැබේ.

(iii) පහත සඳහන් විභාග එකකින්වත් සමත් වී ඇති අපේක්ෂකයෝ සිංහල/දෙමළ භාෂාව පිළිබඳ විෂයයෙන් නිදහස් කරනු ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීනතා පරීක්ෂණයෙන් උසස් පෙලින් හෝ සාමාන්‍ය පෙලින් හෝ සමත් අපේක්ෂකයෝ,

(ආ) සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයේ IV වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් හෝ V වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් හෝ සමත් වී ඇති අපේක්ෂකයෝ,

(ඇ) සිංහල/දෙමළ භාෂාමය ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

(ඈ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ විෂයයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි භාෂාමය ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

(ඉ) සිංහල/දෙමළ භාෂාමය ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී ඇති අපේක්ෂකයෝ.

9. සාමාර්ථය ලද අයදුම්කරුවන්ගේ නාමයන් ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රසිද්ධ කරනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ, 1973 අප්‍රේල් මස 24 වැනි දින.

විභාග අංකය : ..................................
(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි)

**පළාත් පාලන සේවය—අයදුම්පත**

**පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ (II වැනි ශ්‍රේණියේ) නිලධාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1973**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ප්‍රාදේශීය බල මණ්ඩලයට පළමු පත්වීම ලද දින සහ පරිවර්තනය කරන ලද සාමාජිකයෙක් ද යන වග :————.
3. පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියට පළමුවැනි පත්වීම ලද දිනය :————.
4. දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
5. අයදුම්කරු දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.
6. ගැසට් නිවේදනයේ 7 වැනි ඡේදයේ සිංහල/දෙමළ විෂයයන් ගෙන් නිදහස් කරනු ලැබීමට සුදුසුකම් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :—
   (අ) සමත් වී ඇති විභාගය :————.
   (ආ) විභාගය පැවැත් වූ දිනය :————.
   (ඇ) විභාග අංකය :————.
7. මීට පෙර ඔබ සමත් වූ විෂයයන් සහ සමත් වූ වර්ෂය :————.

8. ඔබ ගන්නා විෂයයන් සඳහන් කරන්න :————.

(i) ගිණුම් හා පළාත් පාලන නීති :————.

(ii) සිංහල (අ) සාකච්ඡාව හා අර්ථ නිරූපනය :————.

(ආ) කියවීම හා ලිවීම :————.

(iii) දෙමළ (අ) සාකච්ඡාව හා අර්ථ නිරූපනය :————.

(ආ) කියවීම හා ලිවීම :————.

සැළකිය යුතුයි.—සිංහල/දෙමළ පරීක්ෂණ කොටස් දෙකකින් යුක්තයි.

(අ) සාකච්ඡාව හා අර්ථ නිරූපනය :————.

(ආ) කියවීම හා ලිවීම :————.

9. විභාගයට පෙනී සිටින්නේ පහත සඳහන් කුමන මාධ්‍යයකින් ද :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

10. ඔබ මෙම විභාගයට පෙනී සිටින්නේ පළමු වරටද යන්න සඳහන් කරන්න :————.

මුද්දර කොටුව

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : 1973.........මස......වැනි දින.

ලේකම්,
ප. පා. සේ. කොමිෂන් සභාව,
තැ. පෙ. 530, කොළඹ.

ඉහත නම සඳහන් අයදුම්කරු මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ සේවයේ යෙදී සිටින බවත්, ඔහු පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියේ සිටින බවත්, සහතික කරමි. ඔහු ඉහත සඳහන් විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකි. ඔහු, ඔහුගේ අයදුම්පතේ දී ඇති විස්තරය නිවැරදි වේ.

————,
නාගරික කොමසාරිස්/සභාපති.
නාගරික සභාව/පළාත් ආණ්ඩු සභාව.

දිනය : 1973 .........මස .........දින.

5-96 —73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## වරකාපොල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වගන්තිය යටතේ වරකාපොල සුළු නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ගාමිණී වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අප්‍රේල් මස 4 වැනි දින,
කොළඹ දී.

### අතුරු ව්‍යවස්ථා

1. (i) මේ අතුරු ව්‍යවස්ථා 1973 වරකාපොල පොදු වෙළඳ පොල අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

(ii) "වරකාපොල පොදු වෙළඳ පොල" නමින් හඳුන්වනු ලැබීමට නියමිත හා එසේ හැඳින්වෙන පොලක් සෑම සෙනසුරාදා දිනයකදී හෝ සභාව විසින් නියම කරන වෙනයම් දිනයකදී සභාව විසින් පැවැත්විය යුතුය.

2. වරකාපොල පොදු වෙළඳ පොල භූමියේ සිට යාර හාරසිය හතලිහක අර්ධ විෂ්කම්භයක කවයක් ඇතුළතවූ ප්‍රදේශයේ, එකී වෙළඳ පොල සඳහා වෙළඳ පොල ප්‍රදේශය බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3. (i) සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන්නෙකු හෝ එලෙස අවසර පත්‍රයක් දරන්නෙකු ගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු හැර වෙනත් කිසිම තැනැත්තෙකු විසින් පොල පිහිටි භූමිය ඇතුළත කිසියම් වෙළඳ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

(ii) (i) වැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි වූ 1 වැනි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සරානුකූලව විය යුතු අතර නිකුත් කරන දිනයට පමණක් වලංගු විය යුතු ය.

4. පොල පිහිටි භූමිය ඇතුලතවූ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරණ සෑම තැනැත්තෙකු විසින්ම මෙහිවූ දෙවැනි ලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාන අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

5. 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තු එකතු කර ගැනීමට සභාව නිලධාරියෙකු නොයොදවන්නේ නම් ගාස්තු එකතු කර ගැනීමේ අයිතිය—

(අ) පෞද්ගලික ගිවිසුමක් මගින්, හෝ

(ආ) ටෙන්ඩර් කැඳවීමෙන්, හෝ

(ඇ) ගාස්තු එකතු කිරීමේ අයිතිය ප්‍රසිද්ධ වෙන්දේසියේ දැමීමෙන් සභාව විසින් යම් අනුමත කරන ලද තැනැත්තෙකුට බදු දීමට හැකිය.

6. (i) 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරණ කිසිම තැනැත්තෙකු විසින් පොල පිහිටි භූමිය ඇතුලත යම් මස් වර්ගයක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

එසේ වුවද එවැනි භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සභාපති විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන විශේෂ අවසර පත්‍රයක් මගින් ලබන බලය යටතේ, එසේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කළ හැකිය.

(ii) එවැනි අවසර පත්‍රයක් නිකුත් කිරීමට සුදුසු වූ ද ප්‍රමාන වත් වූද හේතු ඇතැයි සභාපති සැගිමට පත් වුවහොත් මිසක එබඳු විශේෂ අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

7. (2 වැනි අතුරු ව්‍යවස්ථාව) යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලය ලත් සේවකයන් අතර හෝ ඔවුන් සහ මහජනයා අතර වෙළඳ පොල පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇතිවන යම්කිසි ආරාවුලක් සභාපති විසින් බලය පවරනු ලැබූ රාජකාරියේ යෙදී සිටින කිසියම් නිලධාරියෙකු විසින් පොල පිහිටි භූමිය තුලදී නිරවුල් කළ හැකිය.

8. පොල පිහිටි භූමිය තුල සාමය පවත්වා ගැනීම එම කාර්ය සඳහා සභාව විසින් පත් කරනු ලබන සහ පොල පිහිටි භූමිය තුල රාජකාරියේ යෙදී සිටින නිලධාරියෙකු විසින් කල යුතුය.

9. බඩු මිළදී ගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොලට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින්ම සභාවේ නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් ආරාවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා දෙනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදිය යුතු ය.

10. කිසිම තැනැත්තෙකු පොල පිහිටි භූමිය ඇතුළත—

(අ) යම් පිසීමක් කරගෙන යාම, හෝ

(ආ) අවිනීත අන්දමින් හැසිරීම හෝ කිසියම් ශබ්දයක් හෝ කරදරයක් කිරීම හෝ වෙනත් යම් තැනැත්තෙකු සමග දබර කර ගැනීම හෝ අපහාසාත්මක, නින්දා සහගත හෝ අවිනීත වචන පාවිච්චි කිරීම, හෝ

(ඇ) සභාවේ නිලධාරියෙකු විසින් හෝ ග්‍රාම සේවක හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපතියේ බලය යටතේ කටයුතු කරන යම් තැනැත්තෙකු විසින් හෝ ඉවත්ව යන ලෙස නියම කරනු ලැබීමෙන් අනතුරුවත් තවදුරටත්, රැඳී සිටීමට සැහෙන හේතු නොපෙන්වා රැඳී සිටීම හෝ සුනංගු වීම හෝ නොකළ යුතු ය.

11. (1) පොල පිහිටි භූමිය ඇතුලත විකිණීම සඳහා ප්‍රදර්ශනය කොට ඇති යම් ආහාර ද්‍රව්‍යයක් ආහාර පිණිස යෝග්‍ය නොවන බව තමාට පෙනී ගිය හොත්, සභාපති විසින් හෝ වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන යම් සෞඛ්‍ය පරීක්ෂකයෙකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂාකොට තහනමට ගැනීම නිත්‍යානුකූල විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් ආහාරයට නුසුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබුවහොත්, ඒ ද්‍රව්‍ය තහනම් කිරීමේදී එය අයිතිව තිබූ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කල හැකිය.

12. (1) සභාපති විසින් වෙළඳ පොල පරිපාලනය කරනු වස් පත් කරන ලද යම් නිලධාරියෙකු හෝ තැනැත්තෙකු රාජකාරියේ යෙදී සිටියදී කිසිම තැනැත්තෙකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකල යුතුය.

(2) කුලී ගාස්තු අය කර ගනු වස් සභාව විසින් හෝ (කුලී ගාස්තු එකතු කිරීමේ අයිතිය බදු දී ඇති අවස්ථාවක නම්) බදු හිමියා විසින් හෝ පත් කරනු ලබන කිසියම් තැනැත්තෙකු රාජකාරියේ යෙදී සිටියදී යම් තැනැත්තෙකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකල යුතුය.

13. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) පොල පැවැත්වෙන දිනයට පූර්ව දිනයෙහි පූර්ව භාග 12.00 ට පෙර පොල පිහිටි භූමිය ඇතුලත යම් මඩු හෝ පියස්ස සහිත ආකෘති ඉදි කිරීම හෝ පැදුරු හෝ ගෝනි තැබීම, හෝ

(ආ) පොල පැවැත්වෙන දිනයට පසු දින පෙ. ව. 9.00ට පසුව පොල පිහිටි භූමිය තුල යම් මඩු හෝ පියසි සහිත ආකෘති හෝ පැදුරු හෝ ගෝනි හෝ වෙනයම් ද්‍රව්‍යයක් තැබීම.

නොකල යුතුය.

14. පොල පැවැත්වෙන දිනයට පසු දිනයෙහි පෙ. ව. 9.00 පසුව පොල පිහිටි භූමිය ඇතුලතවූ ඉවත් නොකොට තබා ඇති යම් මඩු, පියස්ස සහිත ආකෘති, පැදුරු, ගෝනි හෝ වෙනයම් ද්‍රව්‍යයක් සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ වෙනයම් නිලධාරියෙකු විසින් ඉවත් කිරීමට සැලැස්වීම නිත්‍යානුකූල විය යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථා අතුරෙන් කිසිවක් උල්ලංඝනය කරනු ලැබුවහොත්, රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි විය යුතු අතර, නිසි අධිකරණ බලය ඇති උසාවියකින් වැරදිකරු බව ඔප්පු කරනු ලැබීමෙන් අනතුරුව හෝ සභාපති විසින් හෝ සභාපති විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් එකී උල්ලංඝනය කිරීම ගැන අවධානය යොමු කරමින් ලිඛිත නිවේදනයක් භාර දෙනු ලැබීමෙන් අනතුරුව උල්ලංඝනය කිරීම අඛණ්ඩව කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකින් ද දඬුවම් කළ හැකි විය යුතු ය.

I වැනි උපලේඛනය

වරකාපොල සුළු නගර සභාව

වරකාපොල පොදු වෙළඳපොළ

දිනය: 19....................

...................... ............................................................ ගෙන්

රු.............................ශත ................. ක් භාර ගතිමි.

| | | | රු. ශත |
|---|---|---|---|
| (1) කඩ කාමර/බිම් කොටස් අංක | ... | ... | |
| (2) කෙසෙල්/පුවක්/තැඹිලි | ... | ... | |
| (3) වාහන | ... | ... | |
| (4) වෙනත් අය කිරීම් | ... | ... | |
| එකතුව ... | | | |

..................................

මුදල් අය කරන නිලධාරියා.

II වැනි උපලේඛනය

| | | | දිනකට රු. ශත |
|---|---|---|---|
| 1. හතරැස් අඩි 80 ක වර්ග ප්‍රමාණයක් ඇති එළවලු කඩ කාමරයක් සඳහා | ... | ... | 2 00 |
| 2. හතරැස් අඩි 25 ක වර්ග ප්‍රමාණයක් ඇති එළවලු කඩ කාමරයක් සඳහා | ... | ... | 1 25 |
| 3. හතරැස් අඩි 80 ක වර්ග ප්‍රමාණයක් ඇති කරවල කඩ කාමරයක් සඳහා | ... | ... | 1 00 |
| 4. හතරැස් අඩි 80 ක වර්ග ප්‍රමාණයක් ඇති බුලත් කඩ කාමරයක් සඳහා | ... | ... | 1 00 |
| 5. එළවලු සඳහා හතරැස් අඩි 16 ක වර්ග ප්‍රමාණයක් ඇති භූමියක් සඳහා | ... | ... | 40 |
| 6. මැටි වළං සඳහා හතරැස් අඩි 30ක වර්ග ප්‍රමාණයක් ඇති භූමි ප්‍රමාණයක් සඳහා | ... | ... | 1 00 |
| 7. කෙසෙල් කැන් 20කට අඩුනම්, එකකට | | ... | 05 |
| 8. කෙසෙල් කැන් 20කට වැඩි නමුත් 25ට නොවැඩි නම් | ... | ... | 1 00 |
| 9. කෙසෙල් කැන් 25කට වැඩි නම් එකකට | | ... | 04 |
| 10. තැඹිලි, කුරුම්බා 100 කට | ... | ... | 60 |
| 11. පුවක් 1,000 කට | ... | ... | 25 |
| 12. මිශ්‍ර ද්‍රව්‍ය සඳහා හතරැස් අඩි 20ට නොවැඩි එලිමහන් භූමි ප්‍රමාණයක් සඳහා | ... | ... | 50 |

5–100—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩ බුලත්ගම පස්බාගේ කෝරළේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 4. 23 වැනි දින,
කොළඹදීය.

අතුරු ව්‍යවස්ථාව

1953 නොවැම්බර් මස 14 වෙනි දින අංක 10,621 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමෙන් උඩ බුලත්ගම පස්බාගේ කෝරළේ ගම්සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVIII වැනි කොටසේ දැක්වෙන ජල සම්පාදන සේවා පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (2) වෙනි ඡේදයට ඉක්බිතිව පහත සඳහන් අළුත් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (3) සභාව විසින් පිහිටුවන ලද ජල සේවයෙන් පෞද්ගලික ජල සේවයක් දී ඇති යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් තමා වෙත යථා පරිදි දැන්වීමක් භාර දෙනු ලැබූ විට, එකී ජල සේවයෙන් ජලය සපයනු ලබන සෑම මාසයක් වෙනුවෙන් ඒ ස්ථානයෙහි සවි කරන ලද එක් එක් අඟල් භාගයේ කරාමය සඳහා රුපියලයි ශත පනහක ගාස්තුවක් ගෙවිය යුතුය. "

පුද්ගලික ජල සැපයීම්වලට අදාල 1969 සැප්තැම්බර් මස 19 වෙනි දින අංක 14,872 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උඩ බුලත්ගම පස්බාගේ කෝරළේ ගම් සභාවේ අතුරු ව්‍යවස්ථාව මෙයින් අවලංගු කරණු ලැබේ.

5–101—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමැතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්,

1973.4.10 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

මීගහකිවුල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නාලද ජල සම්පාදන සේවය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVIII වැනි කොටස එම ගම්සභාවට අදාළ පමණට එහි 27(2) වැනි අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිව පහත සඳහන් ඡේදය ඇතුලත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) සභාව විසින් පිහිටුවනු ලැබූ ජල සම්පාදන සේවයෙන් යම් ස්ථානයකට පුද්ගලික ජල නලයක් සවිකර ඇති විටක එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත යථාපරිදි දන්වීමක් භාරකරනු ලැබූකල්හි, ඔහු විසින් එකී ජල සම්පාදන සේවයෙන් ලබාගන්නා ජලය සඳහා සෑම අවුරුද්දකටම පහතින් දක්වා ඇති ප්‍රමාණයක් අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

#### ගාස්තු ප්‍රමාණයන්

| | පළමුවන අහල් භාගයේ කරාමය සඳහා | අමතර එක් එක් අහල් භාගයේ කරාමය සඳහා |
|---|---|---|
| ගෘහ නො වන වෙනත් කාර්යයන්ට ජලය සැපයීම සඳහා නලය සවිකර ඇති විට ... ... ... | 120.00 ... | 30.00 |
| ගෘහ කාර්යයන්ට ජලය සැපයීම සඳහා නලය සවිකර ඇති විට ... ... ... | 30.00 ... | 12.00 |

5-33—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### දෙවිනුවර නගරය

මුදල් රෙගුලාසි අංක 40 (11) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

1973 අය-වැය ලේඛනය

1 වන පරිපූරක අය-වැය ඇස්තමේන්තුව

පහත සඳහන් වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුදල ඒ ශීර්ෂය යටතේ දැරීමට ඇති වියදම් සඳහා මදි බැවින් පහත සඳහන් අයුරු මුදල් වෙන් කිරීමට 73.4.24 දින අංක 313 දරණ තීරණයෙන් සම්මත කරමි.

ඒ—සාමාන්‍ය.

2 (ඇල), අතිකාල දීමනා රු. 1,100.00

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්,
දෙවිනුවර නගරය.

1973 අප්‍රේල් මස 24 දින,
දෙවිනුවර විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

5-93—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### දෙඩන්දුව සුලු නගර සභාව

අතිරේක අය-වැය ලේඛන අංක 1/1973

1973 පෙබරවාරි 28 දින දෙඩන්දුව සුලු නගර සභා රැස්වීමේ අංක 15 දරණ යෝජනාවෙන් අනුමත කරණ ලදී.

| වැය සිරස | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ2 සී—අයකරන්නන්ට කොමිස් ... ... | 900 | 0 |
| ඒ 2 පී—නිල ඇඳුම් ... ... ... | 90 | 0 |
| එකතුව ... | 990 | 0 |

1973.3.21 දින,
දෙඩන්දුව සුලු නගර සභා කාර්යාලයේදිය.

ඩබ්ලිව්. එස්. ජයසූරිය,
සභාපති,
දෙඩන්දුව සුලු නගර සභාව.

5-94—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### පොලොන්නරුව සුළු නගර සභාව

1972 වර්ෂයේ 3 වැනි පරිපූරක අය-වැය ලේඛනය

1 වෙනි කොටස—සාමාන්‍ය

| වියදම් ශිර්ෂය | | | රු. | ශ. | යෝජනා අංකය හා සම්මතවූ දිනය |
|---|---|---|---|---|---|
| ඒ—සාමාන්‍ය වියදම් | (1) නිලධාරීන්ගේ වැටුප් | (ඩී) කාර්යාල කාර්ය සහායකයෝ ... | 4 | 21 | 6(3) හා 72.12.30 |
| | (2) සංස්ථා වියදම් | (ඒ) අතිරේක දීමනා ... | 9 | 30 | එම |
| ඩී—මහජන සෞඛ්‍යය | (2) කසළ ශෝධනය | (ඒ) දෛනික වැටුප් ... | 233 | 72 | එම |
| | (3) වැසිකිළි ශෝධනය | (ඒ) දෛනික වැටුප් ... | 337 | 26 | එම |
| | | එකතුව ... | 584 | 49 | |

1973 අප්‍රේල් මස 12 වෙනි දින,
පොලොන්නරුව,
සුළු නගර සභා කාර්යාලයේදිය.

පූ. ලි. බෞද්ධසාර,
සභාපති,
පොලොන්නරුව සුළු නගර සභාව.

5—95—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

### අගලවත්ත සුළුනගරසභාව

මුදල් රෙගුලාසි අංක 40(II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය (4)

1972 අය–වැය ලේඛනයෙන් ඒ ඒ වැය ශීර්ෂ යටතේ ඉතුරුවේයයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර, අවශ්‍යවී ඇති අතිරේක වැය සඳහා යෙදවීමට, 1972.12.30 වැනි දින පවත්වන ලද මෙම සුළු නගර සභාවේ මාසික සභා රැස්වීමේදී අංක 6 දරණ යෝජනාවෙන් ඒක මතිකව සභා සම්මතවිය.

1972 අය–වැය ලේඛනය—පලමුවැනි කොටස—සාමාන්‍ය

| මුදල් ඉතුරු වැය ශීර්ෂ | රු. ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය. | රු. ශ. |
|---|---|---|---|
| ඒ 2 එම—අතිකාල දීමනා ... ... ... | 50 0 | ජේ 1—පුස්තකාල භාරකරු වැටුප් ... ... | 50 0 |
| එකතුව ... | 50 0 | එකතුව ... | 50 0 |

දෙවැනි කොටස—විදුලිය අංශය

| | | | |
|---|---|---|---|
| විදුලිය 3 ඒ—උපකරණ ... ... ... | 200 0 | විදුලිය 4 ඒ—පරිපාලන වේතන හා දීමනා ... | 50 0 |
| | | විදුලිය 4 බී—එලිමහන් සේවක වැටුප් හා දීමනා ... | 150 0 |
| එකතුව ... | 200 0 | එකතුව ... | 200 0 |

1972.12.30 වැනි දින,
අගලවත්ත, සුළු නගර සභා කාර්යාලයේදීය.

ඒ. ඩී. මර්වින් සමරනායක,
සභාපති,
අගලවත්ත සුළු නගර සභාව.

අනුමත කරමි.

1972.12.30 වැනි දින,
කළුතරු ප. පා. ස. කො. කාර්යාලයේදීය.

ලී. ජෝ. ඒ. වික්‍රමසේකර,
ප. පා. ස. කොමසාරිස්තැන, කළුතර.

5—32—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

## දේපළ විකිණීම්

### වත්තේගම නගර සභාව

හිඟ වරිපනම් ගාස්තු නොගෙවීම නිසා දේපල විකිණීමයි

වත්තේගම නගර සභා සීමාව තුල පිහිටි මීට යාව ඇති උප ලේඛණයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් බදු අය කර ගැනීමට තහනම් කරන ලද චංචල දේපල සහ තහනම් කිරීම සඳහා චංචල දේපල නොමැති වූ කල්හි මහ නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරිය) 252 වැනි ඡේදය ප්‍රකාර මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුළී සහ ලාභ (2) ඇව සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරණ (4) පහත සඳහන් දේපලම ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේ දී ගෙවනු නොලැබුවහොත්, එකී උප ලේඛණයන්හි සඳහන් දිනයන්හි පෙරවරු 9 සිට ආරම්භ කොට චංචල දේපල වත්තේගම නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ද, නිශ්චල දේපල එකී දේපල පිහිටි ස්ථානයේ දී ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඇස්. බී. දොලපිහිල්ල,
විශේෂ කොමසාරිස්,
වත්තේගම නගරය.

1973 අප්‍රේල් මස 06 වෙනි දින,
වත්තේගම නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දිය.

#### උප ලේඛනය

චංචල දේපල

1973 ජූනි මස 4 වෙනි දින පෙරවරු 9 සිට
කොට්ඨාශ අංක 1—මාතලේ පාර :—වරිපනම් අංක 103
අල්මාරි 1 යි.

නිශ්චල දේපල

1973 ජූනි මස 4 වෙනි දින පෙරවරු 9.00 සිට

කොට්ඨාශ අංක 1

ඇල්කඩුව පාර :—වරිපනම් අංක 36

කොට්ඨාශ අංක 2

මාතලේ පාර :—වරිපනම් අංක 63/ඒ
1973 ජූනි මස 5 වෙනි දින පෙරවරු 9.00 සිට

කොට්ඨාශ අංක 5

වාවින්න පාර :—වරිපනම් අංක 40/6, 55/1, 40/7, 55/2 40/8, 55
1973 ජූනි මස 6 වෙනි දින පෙරවරු 9.00 සිට

කොට්ඨාශ අංක 5

අතලහගොඩ පාර :—වරිපනම් අංක 21/58, 21/10, 37/1, 42/5
කොරහිටියාදෙණිය පාර :—වරිපනම් අංක 12//2, 12/, 8, 10
පිටියගෙදර පාර :— වරිපනම් අංක 11
1973 ජූනි මස 7 වෙනි දින පෙරවරු 9.00 සිට

කොට්ඨාශ අංක 5

තැපැල් කාර්යාල පාර :— වරිපනම් අංක 51/9, 51/8, (57/4) 13

කොට්ඨාශ අංක 6

නුවර පාර :— වරිපනම් අංක 123
අතලහගොඩ පටු මග : වරිපනම් අංක 56, 20/19
1973 ජූනි මස 8 වෙනි දින පෙරවරු 9.00 සිට

කොට්ඨාශ අංක 7

කුඹුගල පාර :—වරිපනම් අංක 29/9, 28, 29/48
උඩුරාවණ පාර :—වරිපනම් අංක 15/1

කොට්ඨාශ අංක 4

පන්විල පාර :—වරිපනම් අංක 255

5–38—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## පෑලියගොඩ නගර සභාව

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 55 (3) ඡේදය යටතේ පෑලියගොඩ නගර සභාව 1973 මාර්තු මස 12 වන දින මෙහි පහත උපලේඛනයේ පළමුවන තීරයේ දක්වෙන මංමාවත්හි නම්, දෙවැනි තීරයේ සඳහන් පරිදි වෙනස් කිරීමට තීරණය කළ බවත්, මීට යම් විරුද්ධතාවයක් තිබේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට සති දෙකක් ඇතුළත මා වෙත කරුණු ඉදිරිපත් කරන ලෙසත් මෙයින් නිවේදනය කරමි.

පී. අමරසිංහ,
සභාපති,
නගර සභාව, පෑලියගොඩ.

1973 අප්‍රේල් මස 26 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය |
|---|---|---|
| දැනට භාවිතා කරන නම | | යෝජිත නම |
| 1. නුගේ පාර | ... | 1. වින්සන්ට් රාජපක්ෂ මාවත |
| 2. ගුරුකුල පටුමග | ... | 2. ධම්මානන්ද පටුමග |

5–98—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

1973 වර්ෂයේ වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා වූ වේයන්ගොඩ සුළු නගර සභාවේ වරිපනම් බදු ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරික්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥා පනතේ 165 වැනි වගන්තියෙහි කියවෙන පරිදි (252 වෙනි අධිකාරය) නාගරික සභා ආඥා පනතේ 235(1) දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

1973 අප්‍රියෙල් 10 වැනි දින,
වේයන්ගොඩ සුළු නගර සභාව.

5–26—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

## කඩුගන්නාව නගර සභාව

1973 වර්ෂයේ වරිපනම් බදු පොත

කඩුගන්නාව නගර සභාවේ 1973 වර්ෂය සඳහා වූ වරිපනම් බදු පොත් දැනට සූදානම්ව කායසීල වේලාවන් තුළදී පරීක්ෂාකර බැලීම සඳහා මෙම සභා කායසීලයේ විවෘතව ඇති බව, නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 166 වැනි කොටස සහ නාගරික සභා ආඥා පනතේ (252 අධිකාරය) 235 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති,
කඩුගන්නාව නගර සභාව.

නගර සභා කායසීලය,
කඩුගන්නාව, 1973.04.23 දින.

5–97—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

## අගලවත්ත සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බල පත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන අගලවත්ත සුළු නගර සභා සීමාව තුල යම් කෙනෙක් විරුද්ධ වන්නේනම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණ මතයැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුලතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාම | | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|---|---|
| 1. ඒ. අයි. කබීර් මහතා, නො. 11, කෙලින් වීදිය, මතුගම | .... | හරක් මස් | ... | අගලවත්ත පොදු වෙළඳ පොලේ හරක් මස් කඩය |
| 2. ඒ. අයි. කබීර් මහතා, නො. 11 කෙලින් වීදිය, මතුගම ... | ... | එළු මස් | ... | අගලවත්ත පොදු වෙළඳ පොලේ එළු මස් කඩය |

ඒ. ඩී. මර්වින් සමරනායක,
සභාපති,
අගලවත්ත සුළු නගර සභාව.

1972.11.29 දින,
අගලවත්ත සුළු නගර සභා කායසීලයේදීය.

5–99—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ ව්‍යවස්ථා) පනත (261 වැනි අධිකාරය)

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වැනි වගන්තිය යටතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ:—

යෝජනාව

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, (අංක 1 සිට 37 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව)

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 ජූලි මස 8 වැනි දින දරණ අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා කාණ්ඩද, (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව)

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මතකර ගැනීමට පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු ගම්සභාව විසින් ප්‍රාදේශික බල මණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනා කර සිටිනු ලැබේ.

ඩබ්ලිව්. පී. කැණිසියස් පීරිස්,
පුත්තලම් පත්තු ගම්සභාවේ සභාපති.

1973. 03. 14 දින,
මදුරන්කුලි ගම්සභා කාර්යාලයේ දීය.

4–104—73.05.04 වැනි දින අංක 58 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**
(සැම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වා ද වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක් පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා පළකරන්නට නියමිත 'පිටපත' කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ ''ගැසට්'' පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | මිළ ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| මැයි | 73.05.04 සිකුරාද | 73.04.27 සිකුරාද දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද | 73.05.04 සිකුරාද දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද | 73.05.11 සිකුරාද දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද | 73.05.18 සිකුරාද දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද | 73.05.25 සිකුරාද දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද | 73.06.01 සිකුරාද දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද | 73.06.08 සිකුරාද දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද | 73.06.14 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද | 73.06.22 සිකුරාද දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.